**තේමාව/ උත්සවය**

2026 වසරේ ශ්‍රී ලංකාව තුළ ලෝක ක්ෂය රෝග දිනය සැමරීම

**හැඳින්වීම**

ක්ෂය රෝගය නිසා සිදුවන සෞඛ්‍ය, සාමාජීය හා ආර්ථික බලපෑම පිළිබඳව දැනුවත් කිරීමට මෙන්ම ලෝකයෙන් ක්ෂය රෝගය තුරන් කිරීමේ වෑයම ශක්තිමත් කිරීම උදෙසා ලොව පුරා සෑම වසරකම මාර්තු 24 වන දින ලෝක ක්ෂය රෝග දිනය සමරනු ලබයි. ක්ෂය රෝග මර්දන හා ළය රෝග පිළිබඳ ජාතික වැඩසටහනේ හා සෞඛ්‍ය හා ජන මාධ්‍ය අමාත්‍යාංශයේ නායකත්වයෙන් හා අනෙකුත් සියලුම ජාතික හා ප්‍රාදේශීය සෞඛ්‍ය හා සෞඛ්‍ය නොවන පාර්ශවකරුවන් සමග එක් ව 2026 ලෝක ක්ෂය රෝග දිනය ශ්‍රී ලංකාව තුළ සමරනු ලබයි. ක්ෂය රෝගය, මහජන සෞඛ්‍ය කෙරෙහි ඇති බලපෑම සැලකීමට ගනිමින්, මෙවර ලෝක ක්ෂය රෝග දිනය සැමරීමේ ප්‍රධාන අරමුණු වනුයේ ජනතාව තුළ ක්ෂය රෝගය පිළිබඳ දැනුවත් බව වැඩි කිරීම, ක්ෂය රෝගය හැකි ඉක්මනින් හඳුනා ගෙන ප්‍රතිකාර කිරීම හා ක්ෂය රෝගය තුරන් කිරීමේ ඉලක්ක සපුරා ගැනීම සඳහා ශ්‍රී ලංකාව විසින් සිදුකරන කැපවීම නැවත තහවුරු කිරීමයි.

**තේමාව**

ලෝක ක්ෂය රෝග දිනය : ශ්‍රී ලාංකීය නායකත්වයෙන් බලගැන්වූ පුරවැසියන් තුළින් ඔව්, අපට ක්ෂය රෝගය තුරන් කළ හැක.

**අන්තර්ගතය**

සෞඛ්‍ය හා ජන මාධ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති ක්ෂය රෝග මර්දන හා ළය රෝග පිළිබඳ ජාතික වැඩසටහන මගින් 2026 වර්ෂයේ ලෝක ක්ෂය රෝග දිනය සැමරීම නිමිති කරගෙන ක්ෂය රෝගය කලින් හඳුනා ගැනීම, ඉක්මනින ප්‍රතිකාර කිරීම, ප්‍රතිකාර වලට වෛද්‍ය නිර්දේශ මත අනුගත වීම, රෝගය පැතිරීම වැළැක්වීම හා ක්ෂය රෝගයට ඇති සමාජ භීතිකාව අඩු කිරීම යන කරුණු මූලික කරගනිමින් දැනුවත් කිරීමේ වැඩසටහන් හා ආවේක්ෂණ (screening) මාලාවක් සිදුකිරීමට සැලසුම් කර ඇත.

ක්ෂය රෝගය තවමත් ශ්‍රී ලංකාව තුළ සැලකිය යුතු මහජන සෞඛ්‍ය ගැටළුවක්ව පවතී. ලෝක සෞඛ්‍ය සංවිධානයේ ඇස්තමේන්තු වලට අනුව ශ්‍රී ලංකාව තුළ වාර්ෂිකව ක්ෂයේ රෝගීන් 14,000 පමණ හඳුනා ගත යුතු වේ. නමුත්, වාර්ෂිකව හඳුනා ගන්නා රෝගීන් ප්‍රමාණය අඩු මට්ටමේ පවතින අතර 8,000 - 9,000 අතර ක්ෂයේ රෝගීන් ප්‍රමාණයක් පමණක් ශ්‍රී ලංකාව තුළ හඳුන ගනු ලබයි. හඳුනා නොගත් ක්ෂය රෝගීන් 5,000 පමණ සමාජය තුළ ජීවත් වේ.

2025 වර්ෂයේ දී මුළු නව ක්ෂය රෝගීන් 8,125 හඳුනා ගනු ලැබූ අතර, එම රෝගීන්ගෙන් 5,177 ප්‍රමාණයක් පිරිමි පුද්ගලයන් ද 2,948 ප්‍රමාණයක් කාන්තාවන් ද වේ. මුළු ක්ෂය රෝගීන්ගෙන් 5-15% අතර ප්‍රමණයක පිරිසක් ළමා (වයස අවු 14ට අඩු) ක්ෂය රෝගීන් ලෙස හඳුනාගත යුතු වුවත්

2025 වසර තුළ හඳුනා ගෙන ඇත්තේ ළමා ක්ෂය රෝගීන් 231 (3%) පමණි. මෙය ළමා ක්ෂය රෝගීන් හඳුනාගැනීමේ ප්‍රවණතාවය ඉතා අඩු බව මැනවින් පෙන්වා දෙයි.

ක්ෂය රෝග මර්දන හා ළය රෝග පිළිබඳ ජාතික වැඩසටහනෙහි අරමුණු වන්නේ ක්ෂය රෝගයේ රෝග ලක්ෂණ පිළිබඳව, හැකි ඉක්මනින් ප්‍රතිකාර සඳහා යොමු වීම හා ශ්‍රී ලංකාව පුරා විසිරී පවතින, නොමිලේ ක්ෂය රෝග පරීක්ෂණ හා ප්‍රතිකාර ලබාදෙන රජයේ රෝහල් පද්ධතීන් පිළිබඳව ජනතාව තුළ දැනුවත් බව වැඩි දියුණු කිරීමය. බහු ආංශික සහයෝගීත්වය ශක්තිමත් කිරීම තුළින් මෙන් ම ප්‍රජාවේ දායකත්වය ලබාගැනීම තුළින් ද ක්ෂය රෝගයෙන් තොර ශ්‍රී ලංකාවක් බිහි කිරීමේ ප්‍රයත්නය වේගවත් කර ගත හැක.

**ආයතනය පිළිබඳ තොරතුරු**

ක්ෂය රෝග මර්දන හා ළය රෝග පිළිබඳ ජාතික වැඩසටහන, සෞඛ්‍ය හා ජන මාධ්‍ය අමාත්‍යාංශය

දුරකථන : වෛද්‍ය ප්‍රමිතා ශාන්තිලතා, අධ්‍යක්ෂ - 0718178731

විද්‍යුත් තැපෑල: nptccddirector@gmail.com

වෙබ් අඩවිය: https://www.nptccd.health.gov.lk/

Facebook : https://www.facebook.com/NPTCCD

59

<u>**The format for Press Release / Press Briefings through HPB**</u>

| **Topic/event**<br><br>**Commemoration of World Tuberculosis (TB) Day 2026 in Sri Lanka** |
|---|
| **Introduction to the topic/event**<br>(limit to 100 words)<br>World Tuberculosis (TB) Day is commemorated globally on 24th March each year to raise awareness on the health, social, and economic impact of tuberculosis and to strengthen efforts to end TB worldwide. Sri Lanka will commemorate World TB Day 2026 under the leadership of the National Programme for Tuberculosis Control and Chest Diseases (NPTCCD), Ministry of Health and Mass Media, together with national and regional health and non-health stakeholders. This year's commemoration aims to promote public awareness, encourage early diagnosis and treatment, and reaffirm Sri Lanka's commitment to ending TB as a public health threat. |
| **Theme (if any)**<br><br>"Yes! We Can End TB – Led by Sri Lanka, Powered by People" |
| **The main content**<br>( event/message / information / notice)<br><br>In commemoration of World TB Day 2026, the National Programme for Tuberculosis Control and Chest Diseases (NPTCCD) of the Ministry of Health and Mass Media will conduct a series of awareness and advocacy activities to highlight the importance of early detection, prompt treatment, treatment adherence, prevention of transmission, and reduction of stigma related to tuberculosis.<br>Tuberculosis remains a significant public health concern in Sri Lanka. According to World Health Organization (WHO) estimates, around 14,000 TB cases are expected annually. However, reported notifications remain lower, with approximately 8,000–9,500 cases detected each year, indicating a gap of nearly 5,000 undetected TB patients in the community.<br><br>In 2025, a total of 8,125 new TB cases were reported, including 5,177 males and 2,948 females. Although 5–15% of TB cases are expected among children under 14 years, only 231 paediatric TB cases (3%) were detected in 2025, highlighting potential under-detection.<br><br>NPTCCD aims to raise awareness about TB symptoms, early care-seeking, and the availability of free diagnosis and treatment through government health institutions across the country. Strengthening multi-sectoral collaboration and public engagement |

| |
|---|
| remains essential to accelerate Sri Lanka's efforts to end TB in Sri Lanka |
| **If it is an event**<br>( mention Date /Time/Venue) |
| **Details of your institute/programe and the contact numbers**<br><br>National Programme for Tuberculosis Control and Chest Diseases (NPTCCD) of the Ministry of Health and Mass Media<br>• Telephone: Director 0718178731<br>• Email: nptccddirector@gmail.com<br>• Website: https://www.nptccd.health.gov.lk/<br>• Facebook : https://www.facebook.com/NPTCCD |